# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
Fax 011 286 4051


මගේ අංකය / எனது இல / My No. } L2/1/65/චක්‍රලේඛ/2021    ඔබේ අංකය / உமது இல / Your No }    දිනය / திகதி / Date } 2021.07.12

චක්‍රලේඛ අංක - 2021/4

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු වෙත,

<u>ඉඩම් ඔප්පු ලක්ෂයක් ලබාදීමේ කඩිනම් වැඩසටහන</u>

"සෞභාග්‍යයේ දැක්ම" වැඩපිළිවෙල යටතේ මෙරට ජනතාවගේ ඉඩම් අයිතිය ආරක්ෂා කරලීම සඳහා දීමනාපත්‍ර හා බලපත්‍ර ලබාදීමේ කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇත.

02. ඒ යටතේ 2021 වර්ෂය තුළ දීමනාපත්‍ර හා බලපත්‍ර ලක්ෂයක් ලබාදීම ඉලක්ක කර ඇති අතර මේ වනවිට එම ඉලක්කයෙන් සපුරා ගැනීමට හැකිව ඇත්තේ 25% ක ප්‍රතිශතයක් පමණි. එබැවින් 2021 වර්ෂය අවසන් වීමට පෙර දීමනාපත්‍ර හා බලපත්‍ර ලක්ෂයක් ලබාදීම සිදු කළයුතු බැවින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස කාරුණිකව දන්වා සිටිමි.

03. ජනාධිපති ලේකම් විසින් "ඉඩම් බලපත්‍ර ලබාදීමේ බලතල" මැයෙන් 2021.05.31 දින දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කර ඇති ලිපිය අනුව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම නතර කරන ලෙසත්, අවශ්‍යතාවය අනුව එම කටයුතු දිස්ත්‍රික් ලේකම්වරුන් මගින් ඉටුකර ගැනීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබා දී ඇත. කෙසේ වෙතත් පුද්ගලයන් පදිංචි වී සිටින හෝ සංවර්ධනය කර භුක්ති විඳින ඉඩම් සඳහා බලපත්‍ර ලබාදීම අත්හිටුවීමට එමගින් අදහස් කර නොමැති බව ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් මා වෙත දන්වා ඇත.

04. එබැවින් නියමිත පරිදි ඉඩම් කච්චේරි පවත්වා බලපත්‍ර ලබාදීමේ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කරන ලෙස දන්වා සිටින අතර කළුගල් හෝ වැලි කැනීම සඳහා යෝග්‍ය බවට හඳුනාගත හැකි ඉඩම් හා ඒ ආසන්නව පිහිටි ඉඩම් සඳහා පමණක් බලපත්‍ර ලබාදීම තාවකාලිකව අත්හිටුවන ලෙස දන්වා සිටිමි.

05. දීමනාපත්‍ර හා බලපත්‍ර ලබාදීමේ ඉලක්කය සපුරා ගැනීම අප සියළු දෙනාගේම වගකීමක් වන බැවින් ඒ සඳහා ඔබගේ ඉහලම ප්‍රමුඛතාවය ලබාදීමට ක්‍රියා කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

**ජී.ඩී.කීර්ති ගමගේ**

ඉඩම් කොමසාරිස් ජනරාල්

පිටපත් - 01. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
02. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය - කරු. ඔබගේ උපදෙස් අනුව දැ.ගැ.ස.
03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු
04. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු
05. සියළුම අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්වරු / සහකාර ඉඩම් කොමසාරිස්වරු } කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.